## හැඳින්වීම

ලෙගියුම්නේසි කුලයට අයත් පැසියෙලස් වුල්ගාරිස් (*Paseolus vulgaris*) යන උද්භිද නාමයෙන් හඳුන්වනු ලබන බෝංචි ශ්‍රී ලංකාවේ ඉතා ජනප්‍රිය ප්‍රෝටීන බහුල එළවළුවකි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ගොවීන්ට පඳුරු හා වැල් යනුවෙන් ආකාර දෙකක බෝංචි ප්‍රභේද කීපයක් හඳුන්වා දී ඇත.

# වැල් බෝංචි ප්‍රභේද

## කෙන්ටකි වන්ඩර් ග්‍රීන්

දිග සෙ.මී. 17 ක් පමණ වන පැතලි “s” ආකාර හැඩැති කරල් කොළ පාටය. සුදු පැහැති මල් පිපීමට ගතවන කාලය දින 45 කි. බීජ තරමක් දුඹුරු පැහැ වකුගඩු හැඩයක් ගනී. පළමු අස්වැන්න දින 60 කදී පමණ ලැබේ. අස්වැන්න හෙක්.ටොන් 15 ක් පමණ වේ. 1950 දශකයේ ලංකාවට හඳුන්වා දී ඇත.



## කැප්පෙටිපොළ නිල්

දිග සෙ.මී. 18-20 පමණ හා හැඩය ඉලිප්සාකාර රවුම්වන කරල් කොළ පාටය. කරල දෙපැත්තේ සූත්‍රිකාවන් ඇත. ලා දම් පැහැති මල් පිපීම දින 45 දී සිදුවේ. පළමු අස්වැන්න දින 60-65 කින් පමණ ලැබේ. අස්වැන්න හෙක්.ටොන් 25 ක් පමණ වේ. 1999 වර්ෂයේදී නිර්දේශ කරන ලදි.



## බලංගොඩ නිල්

දිග සෙ.මී. 14 ක් පමණ වන කරල් කොළ පාට කෙටි තරමක් නැමුන ස්වභාවයක් ගන්නා අතර දෙපැත්තේ සූත්‍රිකාවන් දක්නට ඇත. වැලේ මුල සිටම කරල් හටගනී. මල් සුදු පැහැතිය. පිපීම දින 43 කදී පමණ සිදුවේ. බීජ දුඹුරු පැහැති වකුගඩු හැඩයක් ගනී. දින 55කින් පමණ පළමු අස්වැන්න ලැබේ. අස්වැන්න හෙක්. ටොන් 25 ක් පමණ වේ. 2002 වර්ෂයේදී නිර්දේශ කරන ලදි. බලංගොඩ ප්‍රදේශයට පමණක් නිර්දේශ කර ඇති මෙය ලංකාවේ වෙනත් බෝංචි වගා කරන පළාත්වලද හොඳින් වැවේ.



## ලංකා බටර්

සෙ.මී. 17 ක් පමණ දිග කරල් කහ පාට රවුම්ය. කරල දෙපැත්තේ සූත්‍රිකාවන් ඇත. මල් දම් පැහැතිය. පිපීමට දින 45ක් පමණ ගත වේ. බීජ කළු පාට වකුගඩු හැඩයක් ගනී. පළමු අස්වැන්න දින 60-70 කින් පමණ ලැබේ. අස්වැන්න හෙක්. ටොන් 25 ක් පමණ වේ. 2002 වර්ෂයේදී නිර්දේශ කරන ලදි.



## ගන්නෝරුව ග්‍රීන්

කරල් පැතලි කොළ පාටය. මල් සුදු පැහැතිය. බීජ දුඹුරු වකුගඩු හැඩයක් ගනී. පළමු අස්වැන්න දින 56 දී පමණ ලැබේ. අස්වැන්න හෙක්. ටොන් 28 ක් පමණ වේ. 2012 වර්ෂයේදී නිර්දේශ කරන ලදි.



## බණ්ඩාරවෙල ග්‍රීන්

කරල් රවුම්ය, කොළ පාට, මධ්‍යස්ථ දිගැතිය, මල් සුදු පැහැතිය. පිපීමට දින 45 ක් පමණ ගත වේ. බීජ කළු පාට වකුගඩු හැඩයක් ගනී. අස්වැන්න හෙක්. ටොන් 25ක් පමණ වේ. 2012 වර්ෂයේදි නිර්දේශ කරන ලදි.



## ගන්නෝරුව බිල්

කරල් රවුම් ලා කොළ පාට මධ්‍යස්ථ දිගැතිය. මල් සුදු පැහැතිය. මල් පිපීමට දින 32ක් පමණ ගත වේ. බීජ දුඹුරු පැහැති වකුගඩු හැඩයක් ගනී. පළමු අස්වැන්න දින 45 දී පමණ ලබාගත හැකිය. අස්වැන්න හෙක්. ටොන් 30ක් පමණ වේ. 2013 වර්ෂයේදි නිර්දේශ කරන ලදි.



## පඳුරු බෝංචි ප්‍රභේද

### වෙරෙකි වැක්ස්

ලා කහ පැහැති කරලක සාමාන්‍ය දිග සෙ.මී. 13 ක් පමණ වේ. සෘජු හෝ තරමක් සෘජු මතු පිට තරමක් රළු කරල දෙපස සූත්‍රිකා නැත. දම්පාට මල් පිපීම සඳහා දින 30 පමණ ගත වේ. අස්වනු නෙළීම දින 45 දී පමණ කල හැකිය. අස්වැන්න හෙක්. ටොන් 5 ක් පමණ වේ. 1946 දී ලංකාවට නිර්දේශ කර ඇත.



### ටොප් ක්‍රොප්

දිග සෙ.මී. 13.5 ක් පමණ වන මධ්‍යම දිගැති කරල් කොළ පැහැතිය. මතුපිට රළු පැතලි රවුම් ආකාර කරල කෙලින් ඇති අතර කෙළවර මදක් නැමී ඇත. මල් ලා දම්පැහැ වන අතර පිපීමට දින 30 ක් පමණ ගත වේ. ඉලිප්සාකාර කෝපි දුඹුරු පැහැ වන බීජවල දුඹුරු පුල්ලි දක්නට ඇත. අස්වැන්න හෙක්. ටොන් 5 ක් පමණ වේ. 1950 දශකයේදී ලංකාවට හඳුන්වා දී ඇත.



### වේඩ්

තද කොළ පාට දිග සෙ.මී. 13 ක් පමණ වන කරල් රවුම් වන අතර කරල දෙපස සූත්‍රිකාව නැත. තරමක් නැමුන ස්වභාවයක් ගනී. දම් පැහැති මල් පිපීමට දින 30 ක් පමණ ගත වේ. බීජ වයලට් දුඹුරු පැහැ වේ. පළමු අස්වැන්න දින 45 දී පමණ ලබාගත හැක. අස්වැන්න හෙක්. ටොන් 5 ක් පමණ වේ. 1952 වර්ෂයේදී ලංකාවට හඳුන්වා දී ඇත.



### සංජය

දිගටි රවුම් කොළ පාට වන කරල් දිග සෙ.මී. 17 ක් පමණ වේ. කරල දෙපස සූත්‍රිකා නැත. මල් ලා දම්පැහැ වන අතර පිපීමට දින 30 ක් පමණ ගත වේ. බීජ රතු දුඹුරු පාට වකුගඩු හැඩතිය. අස්වැන්න හෙක්. ටොන් 10 ක් පමණ වේ. 2005 වර්ෂයේදී නිර්දේශ කර ඇත.




තාක්ෂණික උපදෙස්: ආචාර්ය එච්.එම්. ආරියරත්න - පර්යේෂණ නිලධාරී
චාන්දනී රඹුකන - වැඩසටහන් සහකාර

සම්බන්ධීකරණය: එච්.ඒ.එස්.එන්. හෙට්ටිආරච්චි - පර්යේෂණ නිලධාරී

විමසීම්: උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නොරුව, පේරාදෙණිය
දු.ක. 081-2388011-13

සැකසුම: ශ්‍රව්‍ය දෘශ්‍ය මධ්‍යස්ථානය, ගන්නොරුව

මුද්‍රණය: කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය, ගන්නොරුව





කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි
2015